## ශ්‍රී ලංකා පොලිස් වෛද්‍ය සේවා කොට්ඨාසය

### ශ්‍රී ලංකා පොලිස් වෛද්‍ය සේවා කොට්ඨාසයේ පවතින උප සේවා ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි (විශේෂඥ ශල්‍ය වෛද්‍ය) පුරප්පාඩු පිරවීම සඳහා රාජ්‍ය සේවයේ හා පෞද්ගලික සේවයේ විශේෂඥ ශල්‍ය වෛද්‍ය නිලධාරීන් බඳවා ගැනීම.

පොලිස් වෛද්‍ය සේවා කොට්ඨාසයේ පවත්නා උප සේවා ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී (විශේෂඥ ශල්‍ය වෛද්‍ය) තනතුරේ නිලධරයකුගේ පුරප්පාඩුව සපුරාලීම සඳහා දැනට රාජ්‍ය සේවයේ හා පෞද්ගලික සේවයේ නියුතු විශේෂඥ ශල්‍ය වෛද්‍යවරුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. සුදුසුකම් සපුරා ඇති විශේෂඥ ශල්‍ය වෛද්‍යවරුවන් පහතින් දක්වා ඇති ආකෘති පත්‍රය අනුව, සකස් කරන ලද අයදුම්පත්‍රය අදාළ සහතික පිටපත් ද සමග බහා එවනු ලබන කවරයේ වම් පස ඉහළ කෙලවරෙහි "උප සේවා ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි (විශේෂඥ ශල්‍ය වෛද්‍ය)" යනුවෙන් සඳහන් කර **2026.05.18** දින හෝ ඊට පෙර ලැබෙන සේ අධ්‍යක්ෂ, බඳවා ගැනීම්, අංක 375, ශ්‍රී සම්බුද්ධත්ව ජයන්ති මාවත, කොළඹ 06 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. එදිනට පසුව ලැබෙන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. කුමන හේතුවක් නිසාවත් අයදුම්පත්‍ර පුද්ගලිකව භාර නොදිය යුතු ය.

03. සුදුසුකම් හා පළපුරුද්ද - විශේෂඥ වෛද්‍ය (උපසේවා ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී)

3.1 ක්ෂේත්‍රයට අදාළව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් පශ්චාත් වෛද්‍ය උපාධිය ලබා තිබීම
3.2 ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ විශේෂඥ වෛද්‍යවරයෙකු ලෙස යාවත්කාලීන කරන ලද පූර්ණ ලියාපදිංචිය ලබා තිබීම.
3.3 ක්ෂේත්‍රයට අදාළව අවම වසර 01ක පශ්චාත් පත්වීම් පළපුරුද්ද ලබා තිබීම

04. වැටුප් හා වෙනත් දීමනා සහ පහසුකම්

| රාජ්‍ය සේවයෙන් ඉල්ලුම්කරන වෛද්‍යවරුන් හට දීමනා හා පහසුකම් | | පෞද්ගලික සේවයෙන් ඉල්ලුම්කරන වෛද්‍යවරුන් හට වැටුප්, දීමනා හා පහසුකම් |
|---|---|---|
| උප සේවා ජ්‍යෙ. පො. අ. (විශේෂඥ වෛද්‍ය) නිලධාරි තනතුරට සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය නිලධරයන් තාවකාලිකව මුදා හැරීමේ දී ගෙවන වැටුප | | උප සේවා ජ්‍යෙ. පො. අ. (විශේෂඥ වෛද්‍ය) නිලධාරි තනතුරට අංක අමප/15/0240/606/2013 දරන 2015.04.23 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය යටතේ සෘජුව වෛද්‍යවරුන් බඳවා ගැනීමේ දී ගෙවන වැටුප (සියලු වැටුප් හා දීමනා ශ්‍රී ලංකා පොලිසිය මගින් ගෙවනු ලැබේ.) |
| අදාළ වෛද්‍යවරයා සෞඛ්‍ය අමාත්‍යාංශයේ දරන නිත්‍ය තනතුරට අදාළව සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් ගෙවනු ලබන වැටුප් හා දීමනා ශ්‍රී ලංකා පොලිසිය මගින් ප්‍රතිපූරණය කරනු ලැබේ. | | මූලික වැටුප<br>උපසේවා ජ්‍යෙ. පො. අ. (වෛද්‍ය) රු. 112,030.00 |
| අමතර සේවා දීමනාව (උපරිම පැය 120 සඳහා) සත්‍ය වශයෙන් සේවය කරනු ලබන පැය ගණන පදනම් ව ශ්‍රී ලංකා පොලිසිය මගින් ගෙවනු ලැබේ. | | විශේෂ දීමනාව<br>රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 07/2025 අනුව වැටුපෙන් 22% ක් සමග රු. 1,250.00 |

| | | |
|---|---|---|
| ප්‍රවාහන පහසුකම් | | ජීවන වියදම් දීමනාව - රු. 17,800.00 |
| | | දුෂ්කර දීමනාව - රු. 2,000.00 |
| | | නිල ඇඳුම් පිරිසිදු කිරීමේ දීමනාව - රු. 250 |
| | | ආහාර හා නවාතැන් දීමනාව රු. 34,800.00 |
| | | ප්‍රවාහන පහසුකම් |

4.1 රාජ්‍ය සේවයෙන් බඳවාගනු ලබන වෛද්‍යවරුන් පොලිස් උප සේවයේ ද්විතියන පදනම මත ද, ඉන් පරිබාහිරව බඳවාගනු ලබන වෛද්‍යවරුන් උපසේවා පදනම මත ද, බඳවා ගැනීම සිදු කරනු ලබයි.

4.2 ද්විතියන පදනම මත බඳවා ගන්නා වෛද්‍යවරුන් සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ගෙවනු ලබන වැටුප් වර්ධක සහ සියලු දීමනා ලබා ගැනීමට හිමිකම් ඇති අතර මෙම බඳවා ගැනීම සෞඛ්‍ය සේවයේ ජ්‍යෙෂ්ඨත්වයට බලපෑමක් ඇති නොවේ.

4.3 උපසේවා පදනමින් බඳවා ගන්නා වෛද්‍යවරුන් හට එම තනතුරට හිමි වැටුප් දීමනා හා පහසුකම් සපයනු ලැබේ.

4.4 ප්‍රවාහන පහසුකම් අනුමත දීමනා සහ ඒ ඒ තනතුරට අදාළ අනෙකුත් පහසුකම් සපයනු ලැබේ.

05. සේවා කොන්දේසි

5.1 පොලිස් ආඥාපනතේ විධිවිධාන ඇතුළුව ජාතික පොලිස් කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති, කොන්දේසි සහ චක්‍රලේඛ, ආයතන සංග්‍රහයේ විධිවිධාන, මුදල් රෙගුලාසි, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, භාණ්ඩාගාර චක්‍රලේඛ, ශ්‍රී ලංකා පොලිස් නියෝග, පොලිස් *ගැසට්* නිවේදන, පොලිස්පති චක්‍රලේඛ, වෙනත් උපදෙස් සංග්‍රහවල විධිවිධාන සහ පත්වීම් ලිපියේ ඇතුළත් කොන්දේසිවලට ද යටත් විය යුතු ය.

5.2 සෑම පත්වීමක් සම්බන්ධයෙන් ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 2310/29 හා 2022.12.14 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශිත කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.

5.3 තෝරාගනු ලබන අයදුම්කරුවන්/ අයදුම්කාරියන් පත්වීම් ලැබීමට පෙර පසුබිම් පරීක්ෂණයට ලක්කරනු ලබන අතර පොලිස් සේවයට නුසුදුසු වන අයදුම්කරුවන් අයදුම්කාරියන් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

06. අයදුම්පත සමග පහත සහතිකපත්වල පිටපත් ඉදිරිපත් කළ යුතු ය.

* උප්පැන්න සහතිකය
* ජාතික හැඳුනුම්පත/ විදේශ ගමන් බලපත්‍රය
* වෛද්‍ය සභාව විසින් නිකුත් කරන ලද හැඳුනුම්පත
* වෛද්‍ය උපාධි සහතිකය
* ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ වලංගු ලියාපදිංචි සහතිකය
* වෛද්‍ය වෘත්තියට අදාළ විශේෂ සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සහතික

- වැඩි විස්තර සඳහා විද්‍යුත් ලිපිනය - dir.ro@police.gov.lk

**ප්‍රියන්ත වීරසූරිය,**
පොලිස්පති.

2026 මාර්තු මස 30 දින,
**පොලිස් මූලස්ථානය,**
**කොළඹ 02.**

04 - 237